# ජනපතිවරණ සමයේ සිල්රෙදි බෙදීම ගැන

# මූලික අයිතිවාසිකම් පෙත්සමක්

## වගඋත්තරකරුවන්ට නොතීසි

**ස්ටැන්ලි සමරසිංහ**

ජනාධිපතිවරණ සමයේ රජයේ මුදල් යොදා රට පුරා සිල්රෙදි ඇතුළු විවිධ දේ බෙදාදීමෙන් මැතිවරණ නීති උල්ලංඝනය කිරීමට විරුද්ධව ගොනුකළ මූලික අයිතිවාසිකම් පෙත්සමේ වගඋත්තරකරුවන්ට ජූලි 8 වැනි දින අධිකරණයට පැමිණෙන ලෙස දන්වා නොතීසි නිකුත් කළේය. නිදහස් සහ සාධාරණ මැතිවරණ සඳහා මහජන ක්‍රියාකාරීත්වයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා මෙහි පෙත්සම්කරු වේ. මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්, පොලිස්පති එන්.කේ. ඉලංගකෝන්, මහාමාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, විගණකාධිපති, හිටපු ජනාධිපති ලේකම් සහ නීතිපතිවරයා මෙහි වගඋත්තරකරුවන් ලෙස නම්කර ඇත. අගවිනිසුරු කේ ශ්‍රීපවන්, රෝහිණී මාරසිංහ සහ ප්‍රියසාත් ඩෙප් යන විනිසුරු මඩුල්ල හමුවේ මෙම පෙත්සම කැඳවනු ලැබීය. ජනාධිපති මැතිවරණය පැවැත්වීම ප්‍රකාශයට පත්කිරීමත් සමඟ ජනාධිපතිවරණ මැතිවරණ නීති බලාත්මක වේ. ඒ අනුව රජයේ මුදල් හෝ මහජන දේපළ මැතිවරණ අපේක්ෂකයන්ගේ මැතිවරණ ව්‍යාපාරයට යොදාගැනීම සම්පූර්ණයෙන්ම නීති විරෝධී බව පෙත්සමෙන් පෙන්වා දෙයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඕ (4) ව්‍යවස්ථාව අනුව එවැනි ක්‍රියා වැළැක්වීමට මැතිවරණ කොමසාරිස්වරයාට පියවර ගැනීමට සම්පූර්ණ නෛතික අයිතියක් තිබෙන බව පෙත්සමේ දැක්වේ. එවැනි තත්ත්වයක් බලපැවැත්වෙද්දී මැතිවරණය ඉලක්ක කරගෙන ඡන්ද දායකයන් වෙත බෙදාදෙන ලද වෙනත් භාණ්ඩ අතර රුපියල් මිලියන 100ක් වැය කොට රටපුරා සිල් රෙදි බෙදාදීම කරගෙන ගිය බවද ඒ සඳහා වැය කළේ රජයේ විවිධ ආයතනවල මුදල් බවද පෙත්සමෙන් පෙන්වා දෙයි. මෙය නීති විරෝධී ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවක් බැවින් ඊට සම්බන්ධ සියලුදෙනාටම එරෙහි නීත්‍යනුකූල පියවර ගැනීමට කටයුතු කරන ලෙස පෙත්සම්කරුවෝ අධිකරණයෙන් ඉල්ලා සිටිති. ලිලන්තිද සිල්වා නීතිඥවරියගේ උපදෙස් මත පසිඳු සිල්වා නීතිඥවරයා සමඟ ජ්‍යෙෂ්ඨ නීතිඥ ජේ.සී. වැලිඅමුණ මහතා පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටියේය.

මව්බිම